# “ස්නේහයේ මළගම”

කෙටි කතාව



R.ප්‍රභාත් ද සිල්වා

Publish By - www.lankaketikatha.wordpress.com

# |ස්නේහයේ මළගම කෙටි කථාව

මැයි මල්පිරිච්ච මැයි ගහ යට ඉඳන් මම දේශන ශාලාව දිහාට හෙමින් හෙමින් පියමැන්නා. සිනිඳු මල් පෙති දෙපතුල් යට පොඩි වෙද්දි මගේ හිත හිරිවැටුණා. ආදරෙත් පයට පෑගෙන තරම් දෙයක්ය කියලා මැයි මලක් තරම් වත් එදා නොවැටහුණු මට අද ආදරේ මියගිය මතක රිදුම් දෙනවා.

" සිතූ මාව තේරුම් ගන්න කරුණාකරලා එකම එක වතාවක් මං කියන දේත් අහන්න...... "

" මට ඔයාගෙන් අහන්න දැනගන්න දෙයක් නැහැ.සංජය, අනික විශේෂ කතාබහක් කරන්න මට ඕන කමක් නැහැ. විශේෂයෙන් ඔයත් එක්ක... "

" සිතූ... "

එකපාරටම මගේ වැලමිට ලගින් ශක්තිමත් පිරිමි අතක ස්පර්ෂයක් දැනුණා.

" මේ මොකද?...අතාරිනවා මගේ අත.. මට ලෙක්චර්ස් පරක්කු වෙනවා. "

මගේ පරාජිත ඇස් අස්සේ ඒ හිතුවක් කාරයා විදින සතුටට මම වෛර කරපු වාර අනන්තයි.

" සංජය ඔයා දැන් මගේ ඉවසීමෙ සීමාව නැත්තටම නැති කරනවා "

" ඔයයි මගේ ඉවසීම නැතිකළේ... මාව පිස්සක් කළේ... "

" මොකක්ද? කවුද මට කරදර කර කර පස්සෙන් ආවේ මමද? ඔයාද? පිස්සෙක් වගේ හැසිරෙන් නැතුව ඉගෙන ගන්න. එහෙම නැත්නම් අර අහිංසක දෙමව්පියන්ගේ සල්ලි කන්නේ නැතුව ඉගෙනීම අතෑරලා මැරෙනවා? " නොහිතා කියපු ඒ වචනවල කිසිම පරතෙරක් එදා මට දැනුනේ නැහැ. සරසවි බිමේ සොඳුරු බව පරයා මේ පීඩාකාරීත්වය දැනෙන්න පටන් ගනිද්දී මම දුක්වුණු හඬාවැටුණු වාර අනන්තයි.

" මැරෙන්න ඔව්... මැරෙනවා මම, තමුසේ මට ආදරේ කළේ නැතිනම් ඔව් සත්තකින්ම මම මරාගෙන මැරෙනවා මගේ සිතූ "

සරසවි බිමේ අපමණ සුන්දරත්වයක් මුලදී මම අත්වින්දත් සංජයගේ හිතුවක්කාර ආදරේ නිසා සරසවි බිම මටම එපා වුණා. සංජය සරසවි බිම පුරාවට මාව පෙන්නුවේ එයා

මගේ එකම උරුමකරුවා ගාණට. මගේ හැම ප්‍රතික්ෂේප කිරීමක්ම සංජයට වැදගත් වුනේ නැහැ. හිතුවක්කාර හිනාව නොනවතින කතාව අස්සේ මට මගේ නිදහසම නැතිවුණා.

මම කොච්චර සැරවුනත් සංජය ඇස්වලින් හිනාවෙවී මගේ තරහව මායිම් නොකර සතුටු වුණා. හිනා මල් වැස්සක් පුරවගෙන සටහන් පොත් උදුරා ගනිමින් හිනාවෙද්දි ඒ හිතුවක්කාර කොලුකම එක්ක ආපු හැම කඩාවැදීමක්ම මම පිළිකුල් කළා.සංජය බස්නාහිර පළාතේ  හොඳම ප්‍රතිපල එක්ක සරසවි වරම් ලබපු කඩවසම් තරුණයෙක්. ඒත් ඒ ඇස් හෙව්වේ මගේම ප්‍රතික්ෂේපිත දෑස්ම විතරයි.

“ මට මේ කොල්ලගෙන් ගැලවෙන්න විදිහක් කියපන් මාෂි.. ”

“ ගැලවෙන්න හරි ඇලවෙන්න හරි නිදහසක් උඹට දැන් නෑ. උඹ කැමති උනත් අකමැති උනත් ඌ දැන් උඹේ  එකම උරුමෙ වෙලා ඉවරයි. ”

“ උඹට පිස්සුද මාෂි... මං සංජයට කැමති නෑ...කිව්වොත් කැමති නෑමයි ”

“ අන්න උඹේ උරුමය එනවා. අපි යනවා සිතූ ”

මැයි මල් ගහ යටට එන පටු පාර දිගේ හිනාව පුරවාගෙන එන සංජය දිහා හැඟීම් විරහිතව බලා උන්නු මං මාෂි දිහා බැලුවා.

“ උරුමෙ නෙවෙයි බං මේ නම් මගේ කරුමේ ”

සිමෙන්ති පඩිය ගාව ඉඳගෙන මං හිස දණ මත තියාන ඇස් පියාගත්තේ මේ හිතුවක්කාරයාගේ ඇස් වලින් මිදෙන්න හිතාන.

“ මේ මොකද? මගේ ඒන්ජල්ට සනීප නැතිද? ”

සංජය මං ඉස්සරහ දණ ගහගෙන මගේ හිසට ඒ රළු අතක් තියද්දි මං තරහෙන් නැගිට්ටා.

“ අනේ ඇයි සිතූ ඔයාට සනීප නැද්ද? ”

ඒ ඇස් වල විතරක් නෙවෙයි කටහඬෙත් බිඳුනු බවක් රැඳිලා තිබුණා. මගේ ගැහැණු හිත ටිකක් සසල වෙන තරම් ඒ ඇස් වල ආයාචනය තිබුණා. පිරිමියෙක් වුණාට මේ තරම් ගැහැණු ආත්මයක් ළග පින්සෙණ්ඩු වෙවී ආදරේ ඉල්ලද්දී ඒ ගැහැණු හිත යටි හිතෙන් යම් වින්දනයක් ලබනවා කියලා පොතක තිබුණා මට මතක් වුණා.

“ මට ඇති එකම ලෙඩේ ඔයා සංජය... ”

සංජයට මම වචනයක් වචනයක් පාසා කලේ එයාගේ ඒක පාර්ශ්වික ආදරේ මළගමට සුදු කොඩි වැල් ඇදපු එක. ඒ ආදරේට ඒ හීන වලට පාට දෙන්න මට කිසිම ඕනකමක් තිබුනෙ නැහැ. එයාගේ හැඟීම් මගේ ඉස්සරහ පරාද වෙද්දි මං සතුටු වුණා. සංජය මට ඇත්තටම ආදරේ කරපු බව මට දැනෙද්දී මං හුගක් පරක්කු වැඩියි. ආදරේ කියන හැඟීම මගේ ලෝකය ආක්‍රමණය කලේ හුගක් පරක්කු වෙලා. සංජය හෙවණැල්ලක් වෙලා මං ගාව ඉදිද්දී නොදැනුන ආදරේ එයාගේ තුන්මාසයක සදාකාලික සමුගැනීමට පස්සේ මට තදින්ම දැනෙනවා.

“ සංජය... ඇයි මට පාඩුවේ ඉන්න නොදෙන්නේ මට ඔයා මහ වදයක්.අකමැති දෙයක් බලෙන් ගන්න හදන්න එපා.ඔච්චර උගත් ඔයා වගේ කෙනෙක් මෙහෙම හැසිරෙන්න වටින්නේ නැහැ. ”

ආදරේ ලග අපි හැමකෙනාම බොළදයි කියන න්‍යාය මං දැනගෙන උන්නෙ නැහැ. සරසවියේ හැම නිවාඩු සමයකදීම නික්මෙන්න පෙරාතුව ලෝකේ තියෙන නපුරුම විදිහට මං සංජයට සැළකුවෙ. හැම වැකේෂන් එකකම එයාගේ ප්‍රතිචාරය මගේ හිත හිරිවැට්ටුවා.

“ බුදු සරණයි සිතූ ”

“ පරිස්සමට කල්පනාවෙන් යන්නග ගෙදර ගිය ගමන් මට රින්ග් කට් එකක්වත් තියන්න. මම ඔයාට පණටත් වඩා ආදරෙයි. ”

එයාගේ දකුණු අත මගේ හිස මත තියලා එයා එහෙම මුමුණද්දි මං ඒ පිරිමි පහසින් ගැළවුනේ ඒ අහිංසක අත රිද්දලා එයාගේ හිතත් කුඩුපට්ටම් කරලා.

“ මගේ සිතූට තරහ ගියාම මාර ගති මචං ”

මගේ තරහව එයාගේ යාළුවො එක්ක විහිළුවට ගනිද්දී මගේ ඇස් කදුළින් පිරෙනවා. ඒ හිතුවක්කාරයාගේ හිත රිද්දන හොදම විදිහ මගේ කදුලු බව කල්යත්ම මම වටහා ගත්තා.

“ අනේ කෙල්ලේ අඩන්න නම් එපා. විහිළුවක්නේ පැටියෝ කළේ. මේ බලන්න, තරහ ගියාම ලස්සන කෙල්ලො තවත් ලස්සනයි කියලනෙ කීවේ... මං කැමති මගේ සිතූගේ හිනාවට මිසක් කදුළට නෙවෙයි.. ”

“ මගේ සතුටටද සංජය ඔයා කැමති... ”

“ ඔව් දෙයියනේ ඔව්... ඒ මම ඔයාට ගොඩාක් ආ.... ”

“ ඇති ඇති ඉතිරි ටික අහන්න මට ඕන කමක් නෑ. මගේ සතුටට කැමති නම් මගෙන් ඈත්වෙලා ඉන්න මට ඒ හොදටම ඇති ”

සංජයගේ උණුසුම් සුසුමක් මගේ මුහුණට දැවටෙන්න ගනිද්දී මම ඒ වීදුරු සිහින මාළිගා කුඩුකරලා ඈතකට යනවා.

“ මගේ ආදරේ තරම දන්නවා නම් සිතූ, උඹ මට මැරීගෙන ආදරේ කරනවා සත්තයි... ”

කාලය ගත උනේ ගොඩක් ඉක්මනට. මම නොහිතුව තරම් ඉක්මනට සංජයගේ හදිසි අනතුර සරසවි බිමට නුදුරේ සිද්ධ වෙනකල්ම මං ඒ ආදරේ තේරුම් ගත්තේ නෑ. සංජය හරි. මම දැන් එයාට මැරීගෙන ආදරේ කරනවා ඒත් අද එයා...

“ කවදාහරි මං මරෙන්නේ උඹේ ඔය ආඩම්බරකාර ඇස් දෙක දිහා කෙලින් බලාගෙන ”

සංජයගේ වචන මගේ කන් ඇතුළේ තාම දෝංකාර දෙනවා. සංජය සදහටම මගෙන් යන්න හදද්දී මගේ තුන් හිතම හිරිවැටෙද්දියි මගේ ආදරේ අවදි උණේ.

“ සිතූ මගේ සිතූ උඹ මට එක දවසක් හරි ආදරේ කළා නේද? රත්තරනේ? ”

මගේ උකුලේ ලේ ගලන හිස තියාන සංජය එහෙම අහද්දී මගේ පපුව පිච්චුණා. ඒක මැරෙනකල් මට වේදනා දේවි.

“ මගේ සිතූ හිනාවෙලා ඉන්න, අඩන්න එපා කවදාවත් ආපහු මං උඹට වද දෙන්නෑ වස්තුවේ... ඒත් ඔය කටින් එකපාරක් කියපන් මට එක තප්පරේකට හරි උඹ මට ආදරේ කළා කියලා. උඹ ආදරෙයි කිව්වට පස්සේ මං සදහටම යන්නම් සිතූ ”

“ මං ආදරෙයි සංජය... ”

පපුවේ ගැඹුරුම තැනක හැංගුණ කවදාවත් අවදි නොවුන ආදරේ ඔහුගේ මළගමදී ඇහැරිලා. මගේ දෙතොල් සංජයගේ ලේ පිරුණු නළල පුරා ආදරේ හොයද්දී කඳුළු පුරවන් මා දිහා බලාගෙනම ඒ හිතුවක්කාරයා යන්නම ගිහින්. ඒ අපූරු පිරිමි සුවඳ මගේ හිත කඳුලෙන් නාවලා යන්නම ගිහින්. සරසවිය විතරක් නෙමෙයි මුළු කැළණියම මට මහ මහ මූසලයි දැන්.